පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 07

# දෙවන වාර පරීක්ෂණය - 2019

## නාට්‍ය හා රංගකලාව- I, II

පාසලේ නම : ..........................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ..............................................
..............................................

කාලය : පැය 2 යි.

## I – පත්‍රය

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. නාට්‍යමය ලක්ෂණ ඇතුළත් වරණය තෝරන්න.
i. රංගභූමිය, රඟපෑම, රූපණය
ii. අනුකරණය, සමාරෝපය,සංවාද භාවිතය
iii. භූමිකා, චරිත, අනුකරණය
iv. රූපණය, සමාරෝපය, භූමිකා

02. නාට්‍යක තේමාව යන්නෙන් හැඳින්වෙන්නේ,
i. නාට්‍යයේ සාරාංශයයි.
ii. නාට්‍යක පමණක් දැකිය හැක්කකි.
iii. කතා වස්තුවෙන් ප්‍රකාශ කරන අදහසයි
iv. නාට්‍යමය අවස්ථාවයි

03. වෘත්තාකාර රංගභූමියකි,
i. කමත
ii. කරළිය
iii. ප්‍රොසීනියම් වේදිකාව
iv. ජංගම වේදිකාව

04. රූපවාහිනී මාධ්‍යයෙන් විකාශය වන වේදිකා නාට්‍ය පිළිබඳ විශේෂ වැඩසටහනකි.
i පාට පාට
ii. මුතුහර
iii. රංගභූමි
iv. දොරමඩලාව

05. රූපගත කිරීමේ දී සිද්ධීන් අනුපිළිවෙළින් පටිගත කිරීම අවශ්‍ය නොවන මාධ්‍යයක් නම්
i.වේදිකා නාට්‍ය
ii. රූපවාහිනී නාට්‍ය
iii. ගුවන්විදුලි නාට්‍ය
iv. ගීත නාට්‍ය

- 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට පහත තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.

A. මිස්සක පව්වට වැඩම කළ අවස්ථාව
B. චෝල දේශයේ රජතුමා හමුවට ගිය අවස්ථාව
C. කුළුමීමා දමනය කොට මරා දැමූ අවස්ථාව
D. නාගයාට සැත්කම කළ අවස්ථාව
E. වළගම්බා රජු ආරක්ෂා කර ගැනීමට රථයෙන් බසින අවස්ථාව

06. මෙහි දේවානම්පියතිස්ස රජු හා සම්බන්ධ වන්නේ,
i. A
ii. B
iii. C
iv. D

07. බුද්ධදාස රජතුමා හා සම්බන්ධ වන්නේ,
i. A
ii. C
iii. E
iv. D

08. ගජබා රජු හා සම්බන්ධ සිදුවීම නම්,
i. A
ii. C
iii. B
iv. E

Education NCP - www.edncp.lk

09. ස්ත්‍රී චරිතයක් හා සම්බන්ධ සිදුවීම නම්,

i. D　　ii. E

iii. B　　iv. A

10. දෙවන රාජසිංහ රජු හා සම්බන්ධ වන්නේ,

i. A　　ii. B

iii. E　　iv. C

- 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| 11. සගම,පස්ගම,අරත්තන | රතු හැට්ටකාරී |
| 12. සෝබාව දේ මෙපුර | සිරිත් මල්දම |
| 13. නම : සමන්ත භද්‍රාය | නම්පොත |
| 14. කැමට අත දමමින් නොම ගන්නේ | තාරාවෝ ඉගිලෙති |
| 15. දීකිරි දීකිරි | බුද්ධ ගද්‍යය |

- 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට හරි නම් ලකුණද √ ලකුණද වැරදි නම් × ලකුණද යොදන්න.

16. පාලමක ආකෘතියක් නාට්‍යයක දී පසුතල දර්ශනයක් ලෙස යොදාගත හැකිය. (.............)

17. සෑම අවස්ථාවකම සාමුහිකව රංගනයේ යෙදීම ක්ෂණික නිරූපණයක දී අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තකි (.............)

18. චරිතයකට ගැලපෙන ලෙස මුහුණ සකස්කිරීම අංගරචනය ලෙස හඳුන්වයි. (.............)

19. නාට්‍යකදී යොදා ගන්නා නාට්‍යෝපකරණ සෑමවිටකම විශාලව සාදාගත යුතුය. (.............)

20. "අහසින් අවුත් මිණිඅක් නයිඳු යැදුමට" යන කවියෙන් රුවන්වැලි මහ සෑය ඉදි වූ ආකාරය කියැවේ. (.............)

(ලකුණු 20 × 2 = 40)

Education NCP - www.edncp.lk

## නාට්‍ය හා රංගකලාව - II පත්‍රය

❖ **පළමු ප්‍රශ්ණය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01. "පාසල් යන්නට කම්මැලි

මහන්සි වෙන්නට අකමැති
නිදාගන්න හරිම කැමති...."

i. ඉහත ගීත ඛණ්ඩය අයත් නාට්‍ය කුමක්ද? (ලකුණු 02)

ii. එහි අධ්‍යක්ෂවරයා කවුද? (ලකුණු 02)

iii. මෙම නාට්‍යයේ කිරියාට හා ටොමියාට දිව්‍යලෝකයට යාමට අවසර නැත්තේ ඇයි? (ලකුණු 02)

iv. සුරංගනාවියෝ අමරගෙන් ලබා ගන්නා පොරොන්දු 02 ක් ලියන්න. (ලකුණු 02)

v. මෙම නාට්‍යයේ මවගේ චරිතයේ දැකිය හැකි ලක්ෂණ 02 ක් ලියන්න. (ලකුණු 02)

iv. මෙම නාට්‍යයෙන් ගතහැකි ආදර්ශයක් ලියන්න. (ලකුණු 02)

02. i. වේෂභූෂණ යන්නට සමාන අර්ථ දෙන වචනයක් ලියන්න. (ලකුණු 02)

ii. සාමාන්‍ය ජීවිතයේ දී භාවිතා කරනු ලබන වස්ත්‍ර හා ආභරණවලට වඩා නාට්‍යයකට යොදා ගන්නා වස්ත්‍ර හා ආභරණවල දැකිය හැකි වෙනස්කම් 02 ක් ලියන්න. (ලකුණු 04)

iii. ඔබ පන්තිකාමරයේ දී නිර්මාණය කළ රංගාභරණයක් නම් කර එය සකස්කරන අයුරු රූපසටහන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. i. ඔබ දන්නා රංග අභ්‍යාස වර්ග 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. එම රංග අභ්‍යාස වර්ග 02 කට අදාල ක්‍රියාකාරකම් 02 ක් ලියන්න. (ලකුණු 04)

iii. රංග අභ්‍යාසවල නිරතවීමෙන් නළුවෙකුට ලැබෙන ප්‍රයෝජන 03ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. i. ඓතිහාසික කතා ඇසුරින් නිර්මාණය වූ වේදිකා නාට්‍යයක් නම් කරන්න. (ලකුණු 02)

ii. පහත වගුව සම්පූර්ණ කරන්න.

| ආගමික කතා | රජ කතා | වීර කතා | යෝධයින් සම්බන්ධ කතා |
|---|---|---|---|
| 1.................................<br>2................................. | 1....................................<br>2.................................... | 1........................................<br>2........................................ | 1........................................<br>2........................................ |

(ලකුණු 04)

iii. ඓතිහාසික සිදුවීමක් ඇසුරින් නිර්මාණය වී ඇති ගීතයක් සම්පූර්ණයෙන් ලියන්න. (ලකුණු 06)

Education NCP - www.edncp.lk

05. i. රංගභූමිය යන්න හඳුන්වන්න. (ලකුණු 02)

ii. රංගභූමියක දක්නට ලැබෙන මූලික ලක්ෂණ 04 ක් ලියන්න. (ලකුණු 04)

iii. රංගභූමියක රූප සටහනක් ඇඳ දක්වන්න. (ලකුණු 06)

06. i. නාට්‍ය ගීතයක ලක්ෂණ 02 ක් ලියන්න. (ලකුණු 02)

ii. නාට්‍ය ගීතයක් සරල ගීතයකින් වෙනස්වන ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 04)

iii. වෙස්සන්තර නාට්‍යයේ හෝ පද්මාවති නාට්‍යයේ එන ගීතයක් නිවැරදිව ලියා දක්වන්න. (ලකුණු 06)

07. කෑමට කෑදරකම් නොකරන්නේ
තව මට කියමින් කෑ නොගසන්නේ
..............................................................
..............................................................

i. ඉහත කවිය සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

ii. එම කවියෙන් ගත හැකි ආදර්ශ 4ක් ලියන්න. (ලකුණු 04)

iii. පොර බදිමින් කෑමට නොසිතන්නේ
දුව හැපෙමින් වතුරට නොපනින්නේ
ගැඹුරු දියෙන් නෑමට නොවදින්නේ
තනිව ගොසින් නෑමට නොසිතන්නේ

ඉහත කවිය ඇසුරින් කෙටි නාට්‍ය පිටපතක් රචනා කරන්න. (ලකුණු 06)

Education NCP - www.edncp.lk
PAST PAPERS WIKI

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර






- Past Papers
- Model Papers
- Resource Books

for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

# 071 777 4440